# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 203 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 04/02/2024<br>පැය 2310 |

# මාධ්‍ය නිවේදනය

**යාපනය ප්‍රදේශයේ සංවිධානාත්මක අපරාධ කල්ලියක නායකයෙකු බවට සැකකරන පුද්ගලයෙකු අත්අඩංගුවට - වලාන මධ්‍යම දූෂණ මර්දන ප්‍රහාරක ඒකකය.**

යාපනය ප්‍රදේශය දරුණු අපරාධ රැසක් සිදුකල කප්පම් කල්ලියක් ලෙස ක්‍රියාත්මක වන සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක නායකත්වය දෙන බවට සැකකරන පුද්ගලයෙකු ගල්කිස්ස පොලිස් වසමේ යශෝරාපුර ප්‍රදේශයේ දෙමහල් නිවසක රැදී සිටින බවට වලාන දූෂණ මර්දන ප්‍රහාරක ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත 2024.02.04 වන අද දින උදෑසන කාලයේ වැටලීමක් සිදුකර එම පුද්ගලයා අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25ක්වූ ප්‍රභාකරන් කෞසිකන් යන නීලයම් බනෙයි, පිල්ලෙයාර් පාර, මල්ලාකම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොහු ප්‍රභාකරන් කෞසිකන් නොහොත් ප්‍රභා නැමැති අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලබන අතර, සංවිධානාත්මක අපරාධ කල්ලිය තුල KOINSI THAMPA යන සංකේත නාමයෙන් හා 001 යන සංකේත අංකයෙන් හඳුන්වා ඇත.

සැකකරු යාපනය ප්‍රදේශය තුල සිදු කරන ලද විවිධ අපරාධ වලට අදාලව යාපනය මහේස්ත්‍රාත් අධිකරණයේ විවෘත වරෙන්තු 02ක් සහ මල්ලාකම් මහේස්ත්‍රාත් අධිකරණයේ වරෙන්තු 02ක් ඇති බවට අනාවරණය වී ඇත. සැකකරු අයිස් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ අයෙකු බවත් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී මොහු සන්තකයේ තිබී අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 01 මිලිග්‍රෑම් 300ක්, සංවිධානාත්මක කල්ලියේ ලාංජනය යැයි සැකකල හැකි පත්‍රිකාවක් සහ එම ලාංජනය සඳහන් කරන ලද රුපියල් 100/= ක මුදල් නෝට්ටුවක් සොයා ගෙන ඇත.

තෙලිප්පලෙයි, චුන්නාගම්, මාණිප්පායි, යාපනය හා කිලිනොච්චිය යන පොලිස් ස්ථාන වලට වාර්තා වී තිබූ පුද්ගලයින් කපා කොටා ඝාතනය කිරීම, මිනී මැරීමට තැත් කිරීම, අයුතු ජන රාශියක සාමාජිකයෙකුව සිටීම, වාහන වලට පහරදී අලාභ හානි සිදු කිරීම, රාජකාරී යෙදී සිටි පොලිස් නිලධාරීන් කිහිප දෙනෙකුගේ රාජකාරියට බාධා කරමින් වෑන් රථයකින් හප්පා මිනී

මැරීමට තැත් කිරීමේ අපරාධ රැසක් සිදු කර ඇති බවට අනාවරණය වී ඇති අතර මෙම ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා විදේශ රටවල් සමග සම්බන්ධතා පවත්වා ඇති බවට පෙනී ගොස් ඇත.

මෙම සැකකරු රැඳී සිටි යශෝරාපුර ප්‍රදේශයේ නිවසේ කොටසක දැනට මාස කිහිපයකට පෙර මාසිකව රුපියල් 25,000/= ක මුදලකට ලබා ගෙන ඇති බවට අනාවරණය වී ඇති අතර සැලසුම් සහගත ලෙස අපරාධ සිදු කිරීම සඳහා පිටව ගොස් නැවත මෙම ස්ථානයට පැමිණ සැඟව සිට ඇත. මෙම නිවසේ රැඳී සිටින අතරතුර ඩුබායි රාජ්‍ය වෙත රහසිගතව පලා යාමට සැලසුම් කර තිබී ඇති බවට දැනට සිදු කර ඇති විමර්ශන වල දී අනාවරණය වී ඇත.

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**කුලී පදනම මත නිවෙසක් ලබා දෙන්නේ නම් එම නිවස කුලියට ලබාගන්නා පුද්ගලයන් සම්බන්ධයෙන් සාධාරණ සොයා බැලීමක් ද, කුලියට ලබා ගැනීමෙන් පසු කරනු ලබන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සැක සහිත තත්වයක් තිබේ නම් පොලිසිය දැනුවත් කිරීමට ද කටයුතු කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.**

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**